සැ. යු. - (i) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2014/2015 වර්ෂය සඳහා කෑගල්ල අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය මෙම ගැසට් අංකය හා එයට අදාළ පළ කරන දිනය යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,906 - 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා - 2015.03.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 118 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 119 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 122 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

117 – B 080928—302 (2015/03)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 67

MOD/DEF/07/01/AVF/REF/652.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2015 පෙබරවාරි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් හෙට්ටි ආරච්චිගේ වජිර පෙරේරා ආර්එස්පී විපාරෙ (නි/3607)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

03-261

2015 අංක 68

MOD/DEF/10/03/RET/100.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2014 සැප්තැම්බර් මස 12 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්වා ඇත.

එයාර් වයිස් මාර්ෂල් පතිරණහෙලාගේ දොන් ජයනාත් කුමාරසිරි (01322) - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ දී ය.

03-243

---

2015 අංක 69

MOD/DEF/10/03/RET/101.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව - අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

2014 නොවැම්බර් මස 13 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්වා ඇත.

විංග් කමාන්ඩර් දිවාකර වික්‍රමසිංහ රාජපක්ෂ නිසිවාසල මුදියන්සේලාගේ මඩුගල්ලේ වලව්වේ ජයතිලක බණ්ඩාර මඩුගල්ල (01615) - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

03-240

# රජයේ නිවේදන

*මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/62/2014/පිටු/සැ.*

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.03.06 වැනි දින සිට 2015.03.20 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.03.27 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එම් දරන කොට්ඨාසයේ 925 වෙළුමේ 184 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ පැලැන්වත්තේ පිහිටි "ගොඩපරගහ කනත්ත" නමැති ඉඩමේ අංක 21 දරන කැබැල්ලට එම්. ජේ. සේතුංග මානකතැන විසින් 1969.02.13, 22 දිනයන්හි මැන සාදන ලද අංක 484 දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br>*උතුර* : ලොට් 10, 11<br>*නැගෙනහිර* : ලොට් 22<br>*දකුණ* : ලොට් 23 අඩි 20 පළල පාරකට වෙන් කළ<br>*බටහිර* : ලොට් 20<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 20 | 01. ඩී. ආර්. බී. දූර්ගබක්ෂි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1969.06.21 දින අංක 221 දරන විකුණුම් ඔප්පුව<br><br>02. ඩබ්. එම්. ටී. බී. වනිගසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1988.03.01 දින අංක 3635 දරන විකුණුම් ඔප්පුව |

03-253

---

*මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/10/2015/පිටු/සැ.*

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.03.13 වැනි දින සිට 2015.03.27 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.04.03 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඊ දරන කොට්ඨාසයේ 779 වෙළුමේ 206 පත් ඉරුව | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, අලුත්කුරු කෝරළයේ බටහිර කටාන පිහිටි "කුරුඳුකොටුව හෙවත් මහහොරේ " නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 01 දරන කැබැල්ලට ඩබ්. එල්. එච්. ප්‍රනාන්දු බලයලත් මානකතැන විසින් 1996.12.17 දින මැන සාදන ලද අංක 1674ජේ පිඹුර ප්‍රකාර මායිම්<br>*උතුර* : කේ. අන්තෝනි ෆොන්සේකා හා වින්සන්ට් මහීපාලට අයිති ඉඩම<br>*නැගෙනහිර* : කටාන-කොච්චිකඩේ පාර<br>*දකුණ* : ලොට් 4, 3, 2<br>*බටහිර* : එල්. ආර්. ප්‍රනාන්දුගේ උරුමකරුවන්ට අයත් ඉඩම හා වී. මල්කාන්ති අරුච්චලගේ ඉඩම<br>ප්‍රමාණය : අ. 07, රූ. 00, පර්. 00 | 01. දිනපොත් අංක 17808/1997.08.04 දරන පූර්වතා දැන්වීම<br>02. එම්. එෆ්. ස්ප්‍රවුල් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.07.26 දින ලියා සහතික කරන ලද අංක 2367 දරන විකුණුම්කරය |
| ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඊ දරන කොට්ඨාසයේ 779 වෙළුමේ 207 පත් ඉරුව | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, අලුත්කුරු කෝරළයේ බටහිර කටාන පිහිටි "කුරුඳුකොටුව නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 02 දරන කැබැල්ලට ඩබ්. එල්. එච්. ප්‍රනාන්දු බලයලත් මානකතැන 1996.12.17 දින මැන සාදන ලද අංක 1674ජේ පිඹුර ප්‍රකාර මායිම්<br>*උතුර* : ලොට් 01<br>*නැගෙනහිර* : ලොට් 03<br>*දකුණ* : බෙලගහවත්ත පාර<br>*බටහිර* : එල්. ආර්. ප්‍රනාන්දුගේ උරුමකරුවන්ට අයත් ඉඩම<br>ප්‍රමාණය : අ. 03, රූ. 00, පර්. 00 | 01. දිනපොත් අංක 17808/1997.08.04 දරන පූර්වතා දැන්වීම<br>02. එම්. එෆ්. ස්ප්‍රවුල් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.07.26 දින ලියා සහතික කරන ලද අංක 2368 දරන විකුණුම්කරය |
| ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඊ දරන කොට්ඨාසයේ 779 වෙළුමේ 208 පත් ඉරුව | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, අලුත්කුරු කෝරළයේ බටහිර කටාන පිහිටි "කුරුඳුකොටුව" නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 03 දරන කැබැල්ලට ඩබ්. එල්. එච්. ප්‍රනාන්දු බලයලත් මානකතැන විසින් 1996.12.17 දින මැන සාදන ලද අංක 1674ජේ පිඹුර ප්‍රකාර මායිම්<br>*උතුර* : ලොට් 01<br>*නැගෙනහිර* : ලොට් 04<br>*දකුණ* : බෙලගහවත්ත පාර<br>*බටහිර* : ලොට් 02<br>ප්‍රමාණය : අ. 02, රූ. 00, පර්. 00 | 01. දිනපොත් අංක 17808/1997.08.04 දරන පූර්වතා දැන්වීම<br>02. එම්. එෆ්. ස්ප්‍රවුල් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.07.26 දින ලියා සහතික කරන ලද අංක 2368 දරන විකුණුම්කරය |

03-251

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/07/2015/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් සභාධිපත්‍ය දේපළ සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති සභාධිපත්‍ය දේපළ ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.03.13 වැනි දින සිට 2015.03.27 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමඟ 2015.04.03 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එම් කොට්ඨාසයේ 2749 වෙළුමේ 118 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ නාවල පිහිටි "වැටකෙයියා කුඹුර" නමැති ඉඩමට බලයලත් මානක බී. කේ. පී. ඔකඳවල මහතා විසින් 2004.01.30 දින මැන සාදන ලද අංක 29/2004 දරන පිඹුරේ ඒකක බී3 සඳහා මායිම්,<br>*උතුර* : සිමෙන්තියෙන් බැඳි කාණුව<br>*නැගෙනහිර* : මෙම සැලැස්මේ ලොට් බී4<br>*දකුණ* : මෙම සැලැස්මේ ලොට් බී1<br>*බටහිර* : මෙම සැලැස්මේ ලොට් බී2<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 10.20 | 01. පී. හේවාතැන්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2004.04.07 දින අංක 2881 දරන විකුණුම්කරය |

03-252

---

**2014/2015 මහ කන්න රැස්වීම් වාර්තාව**

දඹවින්න ව්‍යාපාරය

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹවින්න ව්‍යාපාරයේ 2014/2015 මහ කන්නය සඳහා කන්න රැස්වීම 2014.12.05 වැනි දින දඹවින්න ශ්‍රී සරණංකර විද්‍යාලයේ දී පවත්වන ලද අතර එහි දී පහත තීරණ ගන්නා ලදී.

1. වගා කරන බිම් ප්‍රමාණය - අක්කර 225
2. වගා කරන බෝගය - වී/උඩරට එළවළු
3. පළමු ජල මුරය නිකුත් කිරීම - 2015.01.10
4. පැල තවාන් දමා අවසන් කිරීම - 2015.01.20
5. පැල සිටුවා අවසන් කරන දිනය - 2015.01.20 සිට 2015.02.28 දක්වා
6. අවසන් ජල මුරය නිකුත් කිරීම - 2015.06.30
7. ඇල වේලි ශුද්ධ නොකරන අයට දඩ මුදල - වී පැලකට රු. 1,000

8. ප්‍රධාන ඇල ශුද්ධ කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ද (අමුණේ සිට උඩ දියඑම වැව දක්වා හා අමුණේ සිට අමුණුමුල්ල ජල බෙදුම දක්වා) කෙත් ඇලවල් ශුද්ධ කිරීම ගොවි සංවිධාන විසින් ද සිදු කරන බවට තීරණය විය.

9. නියමිත දිනට ඇල වේලි ශුද්ධ නොකරන ගොවීන් සඳහා දඩ මුදල් අය කිරීම වාරිමාර්ග ආඥා පනත හා ගොවිජන සේවා පනත අනුව කටයුතු කිරීම.

03-283

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2014.12.16 දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2010.05.26 දිනැති අංක 308 උකස් බැඳුම්කරය සහ 2013.12.27 දිනැති අංක 639 දරන උකස් බැඳුම්කරයට අනුව 2014.10.31 තෙක් නිවාස ණය මත රුපියල් හැට එක් ලක්ෂ හැත්තෑ හත් දහස් අටසිය පනස් පහයි ශත හතලිස් එකක් (රු.6,177,855.41) ක මුදලක් සමඟ ප්‍රතිලේඛනගත ණය (ඒ) මත රුපියල් පනස් හය ලක්ෂ අනූපහ් දහස් හත්සිය පනස් හතරයි ශත පනස් තුනක (රු.5,695,754.53) මුදලක් ද ප්‍රතිලේඛනගත ණය (බී) මත රුපියල් අටලක්ෂ හැටපන් දහස් නවසිය හැටහතයි ශත හතලිස් පහක (රු.865,967.45) ක මුදලක්ද සමග නිවාස ණය රුපියල් හැට ලක්ෂයක් (රු.6,000,000.00) මත වසරකට සියයට දොළහ (12%) බැගින් පොලියක්ද රුපියල් පනස් දෙලක්ෂ තිස්දාහක (රු.5,230,000.00) ක වූ ප්‍රතිලේඛනගත ණය (ඒ) මත වසරකට සියයට දහතුන (13%) බැගින් පොලියක්ද රුපියල් දසලක්ෂයක් (රු.1,000,000.00) ක් වූ ප්‍රතිලේඛනගත ණය (බී) වසරකට සියයට හතරක් (4%) බැගින් පොලියක් ද 2014.11.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 06, රුද්‍රා මාවතේ, අංක 43 4/3 හි පදිංචි කරුප්පයියාහ් සිවකුමාර් මහතා සහ කරුප්පයියාහ් රාධා ක්‍රිෂ්ණන් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 308,639 දරන එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් එක්කෝටි විසිහත් ලක්ෂ තිස්නව දහස් පන්සිය හැත්තෑ හතයි ශත තිස් නවයක (රු.12,739,577.39) මුදල සමග 2014.11.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, පිටකොටුව ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 256 බී දරන හුණුපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හුණුපිටිය ග්‍රාමයේ පිහිටි වරිපනම් අංක 1076 දරන (වැලිකන්ද පාරේ) හික්ගහවත්තේ තුනෙන් එකක පංගුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. එම්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2007 ජනවාරි 21 දිනැති අංක 78/2007 දරන පිඹුරෙහි ලොට් ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ උතුරට අමරසිරි ප්‍රනාන්දුගේ ඉඩමද නැගෙනහිරට වැලිකන්ද පාර, දකුණට ගයානි වී කුමාරසිංහගේ ඉඩමද බස්නාහිරට කලින් ලුසම්මා ප්‍රනාන්දුට අයිති දැන් ඒ. ඊ. පීරිස් ට අයත් ඉඩමද මායිම්ව පර්චස් විසිහතරයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 24.75) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 60/98 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. ආර්. එම්. මාරසිංහ,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
ගැස් වර්ක් ස්ට්‍රීට්,
පිටකොටුව.
2015 පෙබරවාරි මස 07 වැනි දින.

03-417

---

## සෙලාන් බැංකුව පීඑල්සී

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.02.24 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් හා ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාඛාව : පිටකොටුව
ගිණුම් අංකය : 0640-R-29217 - 001

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක :පීකිව් යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. කුගදරන් විසින් සහතික කරන ලද 2005 අප්‍රේල් 19 දිනැති අංක 673 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 13 හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක පීවී 2057 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ (කලින් ලියා පදිංචි අංක පීවීඑස් 6957 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ) යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඩියුරෝ පයිප් ඉන්ඩස්ට්‍රියල් (ප්‍රයිවට්) ලිමිටඩ්, යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි පනස් හතර ලක්ෂ හැට දෙදහස් පන්සිය විස්සයි ශත තිස් තුනක (රු.25,462,520.33) මුදලක්, 2013 නොවැම්බර් 25 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්, එකී රු. 25,462,520.33 මුදල, ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 673 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රයන් හි බදු අයිතිය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, ලියනගේ මුල්ල ගමේ පිහිටි මිනුම්පති විසින් වලංගු කරන ලද අංක ගම් 563 දරන මූලික සැලැස්මේ ලොට් 1 ලෙස නිරූපනය වන කැකොල්කැලේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු ටී. කේ. ධනසේන විසින් සාදන ලද 2000 ජනවාරි 28 දිනැති අංක 2419 දරන සැලැස්මේ සඳහන් ලොට් 10 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : යෝජිත කොළඹ කටුනායක අධිවේගී මාර්ගය දිගේ ආයෝජන මණ්ඩලය සඳහා වෙන් කළ ඉඩම (මීටර් 30 ක් පළල) සහ කලපුව දිගේ ආයෝජන මණ්ඩලය සඳහා වෙන් කළ ඉඩම, නැගෙනහිරට : කලපුව දිගේ ආයෝජන මණ්ඩලය සඳහා වෙන් කළ ඉඩම, සහ ආයෝජන මණ්ඩල ඉඩම, දකුණට : අයෝජන මණ්ඩල ඉඩම සහ පාර සහ බස්නාහිරට : යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය දිගේ ආයෝජන මණ්ඩලය සඳහා වෙන් කළ ඉඩම (මීටර් 30 ක් පළල) යන මායිම් තුල එකී අංක 2419 දරන සැලැස්ම අනුව හෙක්ටයාර දෙකයි දශම හයයි හතයි පහයි හතක් (හෙක්ටයාර 2.6757) ක් නොහොත් අක්කර හයයි රූඩ් දෙකයි පර්චස් දාහතයි දශම බිංදුවයි නවයක් (අ. 6, රූ. 2, පර්. 17.09) ක් විශාල, ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී 886/211 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

03-343

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම.

2014.12.02 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. එස්. කේ. අතුකෝරල විසින් සහතික කරන ලද 2013.10.15 දිනැති අංක 1191 දරන උකස් බැඳුම්කරය අනුව පළමු ණය මුදල සඳහා 2014.10.16 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 22,846,518.67 (රුපියල් දෙකෝටි විසිඅට ලක්ෂ හතලිස් හය දහස් පන්සිය දහඅටයි ශත හැට හතක් පමණි) මුදල සමග රුපියල් 20,773,989.30 (රුපියල් දෙකෝටි හත්ලක්ෂ හැත්තෑතුන් දහස් නවසිය අසූ නවයයි ශත තිහක්) මුදල මත වසරකට සියයට දහතුනක් (13%) බැගින් පොළියක්ද 2014.10.17 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හේරත් මුදියන්සේලාගේ චන්දන කීර්ති බණ්ඩාර මහතා සහ කන්හේලගේ යමුනා කුසුම් කුමාරි මහත්මිය වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1191 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රු. 22,846,518.67 (රුපියල් දෙකෝටි විසිඅට ලක්ෂ හතලිස් හය දහස් පන්සිය දහඅටයි ශත හැට හතක්) මුදල සමග 2014.10.17 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24 හි පදිංචි සමරවික්‍රම ඇන්ඩ් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර නවින්ද සමරවික්‍රම මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) සහ එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, අවිස්සාවේල්ල ශාඛාවේ ශාඛා කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එගොඩවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොරලැස්ගමුවෙහි පිහිටි දෙවන පටුමගේ එගොඩවත්ත වරිපනම් අංක 22/31 සී දරන හල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එම්. සේනක ප්‍රනාන්දු විසින් සාදන ලද 2011.06.03 දිනැති අංක 2314 දරන පිඹුරෙහි ලොට් 1 A 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක 2314 දරන පිඹුරෙහි ලොට් 1 A1, නැගෙනහිරට : දැනට පවත්නා පාර ද, දකුණට : පාර ද, බස්නාහිරට සරත් සහ සුනිල් උරුමකම් කියන දේපළ සහ අංක 2314 දරන පිඹුරෙහි ලොට් 1 A 1 ද මායිම්ව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 57/119 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එගොඩවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොරලැස්ගමුවෙහි පිහිටි එගොඩවත්ත දෙවන පටුමගේ වරිපනම් අංක 22/31 සී දරන හල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එම්. සේනක ප්‍රනාන්දු විසින් සාදන ලද 2011.06.03 දිනැති අංක 2314 දරන පිඹුරෙහි ලොට් A1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : බලයලත් මිනින්දෝරු එන්. ඩී ද කොස්තා විසින් සාදන ලද 1979.12.25 දිනැති අංක 459 දරන පිඹුරෙහි ලොට් 2ද, නැගෙනහිරට : දැනට පවත්නා පාර සහ එකී අංක 2314 දරන පිඹුරෙහි ලොට් A2 ද, දකුණට : අංක 2314 දරන පිඹුරෙහි ලොට් 1A2 සහ සරත් හා සුනිල්ට අයිති ඉඩමද, බස්නාහිරට : සරත්, සුනිල් උරුමකම් කියන දේපළ සමග ආනන්ද උරුමකම් කියන එම ඉඩමේ ඉතිරි දේපළ ද මායිම්ව පර්චස් විසිදෙකයි දශම නවයයි හතරක (අ. 0, රූ. 0, පර්. 22.94) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලුම දේද සමග වේ.

ලොට් 1A1 ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල පහත සඳහන් ඉඩමෙන් බෙදා සීමා නිර්ණය කරන ලද කොටසකි.

එකී බොරලැස්ගමුවෙහි පිහිටි හල්ගහවත්ත නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එන්. ඩී. ද කොස්තා විසින් සාදන ලද 1979.12.25 දිනැති අංක 459 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටසද නැගෙනහිරට : අඩි පාර ද, දකුණට : හල්ගහකුඹුර සහ ජී. බර්නෝමිස්ට අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : අඩි 4 පළල දෙවට පාර ද මායිම්ව පර්චස් තිස් හයක (අ. 0, රූ. 0, පර්. 36) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේද සමග වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

දෙවන උපලේඛනය

එකී බොරලැස්ගමුවෙහි පිහිටි හල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 1985.05.10 දිනැති අංක 1084 දරන පිඹුරෙහි ලොට් 1 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. ඩබ්. සමරකෝන් විසින් සාදන ලද අංක 1273 දරන පිඹුරෙහි අඩි 10 පළල පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : බලයලත් මිනින්දෝරු එන්. ඩී. ද කොස්තා විසින් සාදන ලද අංක 459 දරන පිඹුරෙහි ලොට් 2 හා 3 ද මායිම්ව පර්චස් තුනයි දශම හයයි හයක (අ. 0, රූ. 0, පර්. 3.66) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C66/109 හි ලියාපදිංචි කර ඇත.

එකී බොරගැස්ගමුවෙහි පිහිටි හල්ගහවත්ත නමැති ඉඩමේ අංක 1048 දරන එකී පිඹුරෙහි ලොට් 2 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : අංක 1273 දරන එකී පිඹුරේ අඩි 10 පළල පාර සඳහා වූ පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : හල්ගහවත්ත ද, දකුණට : ලොට් 3 ද, බස්නාහිරට: ලොට් 1 ද මායිම්ව පර්චස් දෙකයි දශම හතරයි හතරක (අ. 0, රූ. 0, පර්. 2.44) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 66/110 හි ලියාපදිංචි කර ඇත.

එකී බොරලැස්ගමුවෙහි පිහිටි හල්ගහවත්ත නමැති ඉඩමේ අංක 1084 දරන පිඹුරෙහි ලොට් 3 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : හල්ගහවත්ත ද, දකුණට : හල්ගහවත්ත ද, බස්නාහිරට: එකී අංක 459 දරන පිඹුරෙහි ලොට් 1 ද, මායිම්ව පර්චස් එකයි දශම හයයි පහක (අ. 0, රූ. 0, පර්. 1.65) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C66/111 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. ජී. සෝමරත්න මයා,
ශාඛා කළමනාකරු.

2015 ජනවාරි මස 30 වැනි දින,
ලංකා බැංකුව,
අවිස්සාවේල්ල,

03-349

---

**මහජන බැංකුව-වේයන්ගොඩ ශාඛාව - 079**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.10.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද අංක 18509 සහ 2011.09.14 දිනැති, උකස්කරය ප්‍රකාර ගෙවීම්,

නිශ්ශංක ආරච්චිගේ දයා ශාන්ත යන අය විසින් පැහැර හැර බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තිස්හය ලක්ෂ හැට හය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑ දෙක (රු. 36,66,666.72) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2013.01.29 දින සිට වාර්ෂිකව 15% බැගින් රුපියල් තිස්හය ලක්ෂ හැට හය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑ දෙක (රු. 36,66,666.72) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තිස්හය ලක්ෂ හැට හය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑදෙක (රු.36,66,666.72) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාට්ස් විසින් එකී අංක 18509 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ උඩුගම්පොල ග්‍රාමයේ පිහිටි හික්ගහවත්ත කැබැල්ල හා දෙල්ගහවත්ත බෙදූ කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ජයන්ත පෙරේරා මහතා විසින් 2011.02.02 දින මැන සකස් කරන ලද අංක 2392 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩමට මායම්, උතුරට : අංක 5565 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 01 ඉතිරි කොටස, ඩබ්. එල්. ධර්මසේනගේ ඉඩම සහ පිඹුරු අංක 5289 සඳහන් ලොට් සී (අඩි 15 ක් පළල පාර), නැගෙනහිරට : ප්‍රධාන පාර සහ ජේ. කේ. එරංග චන්දන රණතුංගගේ ඉඩමට, දකුණට : ජේ. කේ. ඊ. සී. රණතුංගගේ ඉඩම සහ පිඹුරු අංක 1589 සඳහන් ලොට් ඩී (අඩි 10 ක් පළල පාර) බස්නාහිරට : අනිල් සහ අනෙකුත් අයට අයත් ඉඩම සහ ඩබ්. එල්. ධර්මසේනගේ ඉඩම යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර බින්දුවයි රූඩ් එකයි පර්චස් තිස් නවය (අ. 0, රූ. 01 පර්. 39) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් සමගින් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 459/09 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

03-348

---

**සෙලාන් බැංකුව පීඑල්සී**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්‍යු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.10.30 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය

කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාඛාව : රුවන්වැල්ල
ගිණුම් අංකය : 0800-01663690-002

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් සී. එන්. සමරවික්‍රම විසින් සහතික කරන ලද 2012 පෙබරවාරි 9 දිනැති අංක 1486 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මත්තමගොඩ පදිංචි මොහමඩ් යූසුප් මොහමඩ් තසීම් හෙවත් මොහම්මදු යූසුබ් මොහම්මදු තසීම් යන අය බන්ධනදායී වශයෙන් රුපියල් අනූඅටලක්ෂ තිස්හතරදහස් සියයයි ශත හැත්තෑ අටක (රු.98,34,100.78) මුදලක්, 2013 අගෝස්තු මස 26 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 98,34,100.78 මුදල ද, 2013 අගෝස්තු මස 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, වර්ෂයකට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 1486 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ යටියන්තොට ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ සහ මත්තමගොඩ අංක 108 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බෙලිගල් කෝරළේ කඳුපිට පත්තුවේ අම්පෙ - උතුර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. එන්. කාද්ර් විසින් සාදන ලද 1989 දෙසැම්බර් 30 දිනැති අංක 3432 දරන සැලැස්මේ නිරූපනය වන අටුවගාව වත්ත සහ කුරහන්වත්ත නමැති ඉඩමේ ලොට් 2 ලෙස ලකුණු කළ නොබෙදූ 1/2ඉඩම් කොටසට මායිම් : උතුරට : ඒ. ඩබ්ලිව්. එම්. තව්fපීක් ට අයිති ලොට් 1 බී ද, නැගෙනහිරට : මෙහි සඳහන් ලොට්ස් 1 බී, 3 සහ 4 ද, දකුණට : කම්බි වැට සහ බස්නාහිරට : හල්ගහ ලියද්ද කුඹුර වෙන් කෙරෙන කම්බි වැට ද යන මායිම් තුළ රූඩ් දෙකයි පර්චස් දහතුනක් (අ. 0, රූ. 2, පර්. 13) ක් විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පෙර කී ඉඩම නැවත මැන ලොට්ස් දෙකකට බෙදා ඇත. එයින් සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ යටියන්තොට ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ සහ මත්තමගොඩ අංක 108 ග්‍රාම නිලධාරී කොට්ඨාසයට තුළ බෙලිගල් කෝරළේ කඳුපිට පත්තුවේ අම්පෙ - උතුර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු අයි. කොළඹගේ විසින් සාදන ලද 2011 නොවැම්බර් මස 08 දිනැති අංක 2205 දරන සැලැස්මේ නිරූපනය වන අටුවගාව වත්ත සහ කුරහන්වත්ත නමැති ඉඩමේ ලොට් 2 ලෙස ලකුණු කළ බෙදූ ඉඩම් කොටසට මායිම්, උතුරට : පෙර කී අංක 3432 දරන සැලැස්මේ සඳහන් ඒ. ඩබ්ලිව්. එම්. තව්ෆීක් ට අයිති ලොට් 1 බී ද, නැගෙනහිරට : මෙහි සඳහන් ලොට්ස් 1 සහ 3 ද, දකුණට : පැල ඉණි වැට සහ බස්නාහිරට : හල්ගහ ලියද්ද කුඹුර වෙන් කෙරෙන කම්බි වැට ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් දෙකයි දශම දෙකක් (අ. 0, රූ. 1, පර්. 2.2) ක් විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රසිද්ධ කිරීමේ අවස්ථාවේදී අත්සන් කිරීමට සෙලාන් බැංකුව පීඑල්සී හි සහකාර සාමාන්‍යාධිකාරිනී කේ. හැව්. මහත්මියට බලය පැවරිය යුතු බවට තවදුරටත් සම්මත කර ගන්නා ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව්. මහත්මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනි - නීති.

03-344/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී - රද්දොලුව ශාඛාව
## 2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ඔක්තෝබර් 30 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0620-32428193-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් සහතික කරන ලද 2010 නොවැම්බර් 24 දිනැති අංක 2386 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ජාඇල පදිංචි ඉච්චාම්පුල්ලේ ආරච්චිගේ සුනිල් ප්‍රනාන්දු යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑනව ලක්ෂ හයසිය තිස්එකයි ශත තිස් නවයක (රු.7,900,631.39) මුදලක්, 2014 ජුනි 3 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 7,900,631.39 මුදලද, 2014 ජුනි මස 04 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට දහ අට (18%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 2386 බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියා පදිංචි කිරීමේ කොට්ඨාසය තුල අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ රද්දොලුව උපකාර්යාල ප්‍රදේශය තුල කොටුගොඩ ලංසියාවාඩිය පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඒ. එෆ් ප්‍රනාන්දු විසින් සාදන ලද 2000.07.17 දිනැති අංක 3800/2000 දරන සැලැස්මේ නිරූපනය වන ගොරකගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : රොබට් ප්‍රනාන්දු ගේ ඉඩම ද, නැගෙනහිරට : පාර (පී. එස්) ද, දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : පී ලූකස් ප්‍රනාන්දුගේ ඉඩම සහ කේ. මාලා රංජනී ගේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් තිස් එකයි දශම පහයි එකක් (අ. 0, රූ. 0, පර්. 31.51) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව බී 216/81 හි ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

03-344/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කුලියාපිටිය ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0440-34353152-001

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.12.16 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක : පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එම්. එෆ්. ද සේරම් විසින් සහතික කරන ලද 2013 අගෝස්තු 7 දිනැති අංක 2296 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම නාත්තන්ඩිය පදිංචි වර්ණකුලසූරිය වියානි හැරිසන් ප්‍රනාන්දු සහ වර්ණකුලසූරිය තිලිණි අමේලා ප්‍රනාන්දු යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැට අටලක්ෂ හැටහතර දහස් දෙසිය පනස් හයයි ශත අනූනවයක (රු. 68,64,256.99) ක මුදලක්, 2014 සැප්තැම්බර් 15 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 68,64,256.99 මුදලද, 2014 සැප්තැම්බර් 16 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2296 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, කටුගම්පල කෝරළේ උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ 1514 දූනකදෙනිය ග්‍රාම සේවා වසම තුළ දූනකදෙනිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 2013.05.05 දිනැති අංක 11054 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහමුලමූකලානවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : උඩුබද්දාවට යන මහා මාර්ගය ද, නැගෙනහිරට : ඇල්බට් පෙරේරා ගේ ඉඩම ද, දකුණට : ගුණතිලකගේ ඉඩම ද, සහ බස්නාහිරට : සීලවතීගේ ඉඩම යන මායිම් තුල රූඩ් දෙකයි පර්චස් විසිහතයි දශම පහක් (අ.0, රූ. 2, පර්. 27.5) ක් විශාල, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. පෙර ලියාපදිංචිය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 23/18 වේ.

එකී ලොට් 1 පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, කටුගම්පල කෝරළේ උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ 1514 දූනකදෙනිය ග්‍රාම සේවා වසම තුළ දූනකදෙනිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් සාදන ලද 1995.08.31 දැනැති අංක 1827 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද දෙල්ගහමුලමූකලාන වත්ත නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : නාත්තන්ඩිය උඩුබද්දාව ප්‍රධාන පාර ද, නැගෙනහිරට : ඇල්බට් පෙරේරා ගේ ඉඩම ද, දකුණට : ගුණතිලකගේ ඉඩම සහ බස්නාහිරට : සීලවතීගේ ඉඩම යන මායම් තුළ රූඩ් දෙකයි පර්චස් විසි අටක් (අ. 0, රූ. 2, පර්. 28) ක් විශාල, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. පෙර ලියාපදිංචිය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 221/82 වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති

03-344/3

---

**සෙලාන් බැංකුව පීඑල්සී - සංස්ථා සහ අක් වෙරළ බැංකුව ව්‍යාපාර ඒකකය ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පිකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0860-041905-001

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.12.16 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාඛාව : සංස්ථා සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර ඒකකය.
ගිණුම් අංකය : 0860-041905-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. ආර්. පී. කුමාරි විසින් සහතික කරන ලද 2013 මැයි 8 දිනැති අංක 1605 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මීගමුව සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක ඩබ්ලිව්. වි. 1921 දරන විජය ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් මැරයින් සෙන්ටර් යන නාමය විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන වර්ණකුලසූරිය මුතුනාමගොන්නගේ ජෝසප් පීටර් ප්‍රනාන්දු යන අය බන්ධනදායී වශයෙන් රුපියල් එක් කෝටි පන්ලක්ෂ තිස්හත්දහස් දෙසිය හැටතුනයි ශත තිස් හයක (රු. 10,537,263.36) මුදලක් 2014 ජූලි 7 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 10,537,263.36 මුදල ද, 2014 ජූලි 8 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට. එම මුදලට වර්ෂයකට සියයට විසි එක (21%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අය කර ගැනීම පිණිස ඉහත කී අංක 1605 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවේ තලාහේන උපකාර්යාල ප්‍රදේශය තුල දූව, අංක 162 ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ උතුරු වීථිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුල දූව පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ජේ. පෙරේරා විසින් සාදන ලද 2002.11.07 දිනැති අංක 1389 සැලැස්මේ නිරූපනය වන මීගමුව පාර වරිපනම් අංක 161/ඉ (161/බී1) දරන දූව පිහිටි තල්ගහලන්ද නමැති ඉඩමේ ලොට්ස් 1, 2, 3 සහ 4 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. ලීටස් ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : තුඩැල්ල සිට මීගමුව දක්වා මහා මාර්ගය සහ බස්නාහිරට : (බ/මී) ඩබ්ලිව්. එස්. ඒ. කොස්තා විසින් සාදන ලද 1973.10.08 දිනැති අංක 871 සැලැස්මේ ලොට් එම් ද යන මායිම් තුළ පර්චස් විසිදෙකයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 22.2) ක් විශාල, ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව පී 34/07 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච්. මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

03-344/4

---

**සෙලාන් බැංකුව පීඑල්සී- හලාවත ශාඛාව**
2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.12.16 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0150-00001331-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පිකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. ද ලිවේරා විසින් දෙකම සහතික කරන ලද 1993 ජූලි 13 දිනැති අංක 1180 සහ 1994 දෙසැම්බර් 19 දිනැති 2734, ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්ටු විසින් සහතික කරන ලද 1998 ජූනි 30 දිනැති 3451, ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. පී. පීටර්සන් විසින් සහතික කරන ලද 2000 ජූලි 11 දිනැති 249, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. ප්‍රනාන්දු විසින් තුනම සහතික කරන ලද 2003 අගෝස්තු 7 දිනැති 96, 2004 මාර්තු 2 දිනැති 175 සහ 2005 අගෝස්තු 31 දිනැති, 446, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඊ. එන් ජේ. හර්ෂනී විසින් තුනම සහතික කරන ලද 2007 ජූනි 8 දිනැති 82, 2008 පෙබරවාරි 18 දිනැති 152 සහ 2012 ජනවාරි 2 දිනැති 453 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම රාජකඩුලුව පදිංචි රංජිත් ස්වර්ණසිරි පතිරන සහ වීරවර්ධන පතිරැන්නැහැලාගේ ස්වර්ණලතා හෙවත් වීරවර්ධන පතිරනලාගේ ස්වර්ණලතා යන අය බන්ධනදායීන් වශයෙන් රුපියල් හැට එක් ලක්ෂ තිස්හයදහස් හත්සිය අනූහතරයි ශත පහලොවක (රු.6,136,794.15) මුදලක් අයිරා අණ කර මත සහ රුපියල් එක් කෝටි දහසය ලක්ෂ තිස්තුන් දහස් දෙසිය දහහතයි ශත හැට අටක (රු.11,633,217.68) මුදලක්, වාර ණය මත 2014 මාර්තු 17 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී අයිරා අණකර මත රු. 6,136,794.15 ක් සහ වාරණය මත රු. 11,633,217.68 මුදලක් 2014 මාර්තු 18 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට පිළිවෙලින් සියයට විසි හතර (24%) සහ වර්ෂයකට සියයට දහ නවය (19%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1180,2734,3451, 249, 96, 175, 446, 82, 152 සහ 453 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල උතුරු පිටිගල් කෝරළේ අනෛයිවිලුන්දන් පත්තුවේ ආරච්චිකට්ටුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින්

සාදන ලද 2003.02.21 දිනැති අංක 1674 දරන සැලැස්මේ නිරූපනය වන කොන්ගහහේන නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායම්, උතුරට : බලයලත් මිනින්දෝරු ඒ. එම්. පෙරේරා විසින් සාදන ලද අංක 4819 සැලැස්මේ සඳහන් ලොට් ඒ ද, නැගෙනහිරට : පහලවැව බැම්ම දිගේ වෙන් කිරීම ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඒ. එම්. පෙරේරා විසින් සාදන ලද අංක 4819 සැලැස්මේ සඳහන් ලොට් බී 2 බී සහ බස්නාහිරට : හලාවත සිට පුත්තලම දක්වා මහා මාර්ගය දිගේ වෙන් කිරීම ද, යන මායිම් තුල රූඩ් එකයි පර්චස් තිස් හයක් (අ. 0, රූ. 1, පර්. 36) ක් විශාල බිම, වගා, ගොඩනැගිලි, සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

03-344/5

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2014.12.16 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2013.10.03 දිනැති අංක 617 දරන උකස් බැඳුම්කරයට අනුව 2014.10.31 වැනි දින තෙක් ප්‍රතිලේඛනගත ණය (ඒ) මත රුපියල් හැත්තෑ ලක්ෂ හැත්තෑපන් දහස් හත්සිය අසූ පහයි ශත දෙකක (රු. 70,75,785.02) මුදල සමග ප්‍රතිලේඛනගත ණය (බී) මත රුපියල් හාරලක්ෂ තිස් පන් දහස් හාරසිය අසූ දෙකයි ශත අනූ පහක (රු. 4,35,482.95) මුදල සමග රුපියල් දෙලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය නවයයි ශත හතරක (රු. 2,78,709.04) ක මුදලක් සමග රුපියල් හැටතුන් ලක්ෂ අසූ එක් දහසක (රු. 63,81,000) ක ප්‍රතිලේඛනගත ණය ඒ මත වසරකට සියයට දහතුනක් (13%) බැගින් තවදුරටත් පොළිය ද ඒ සමග ප්‍රතිලේඛනගත ණය (බී) මත රුපියල් ලක්ෂ පහක (රු. 5,00,000) මත වසරකට සියයට හතරක් (4%) බැගින් පොළියක් ද, තවද රුපියල් තුන්ලක්ෂ විසිදාහක් (රු. 3,20,000)ක මුදලක් මත වසකරට සියයට හතරක් (4%) බැගින් තවදුරටත් පොළිය ද, 2014.11.01 සිට ගෙවීම නිම කරන දිනය තෙක් නුගේගොඩ, මිරිහාන, එක්වත්ත පාර, අංක 86සී හි පදිංචි දික්මදුගොඩගේ සුනිල් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 617 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් හැත්තෑහත් ලක්ෂ අසූනව දහස් නවසිය හැත්තෑ හතයි ශත එකක (රු. 77,89,977.01) මුදල සමග 2014.11.01 දින විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, ආක 50/3හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුළ අංක 523A දරන මිරිහාන දකුණ ග්‍රාමසේවා කොට්ඨාසයේ එක්වත්ත පාරේ පිහිටි වරිපනම් අංක 86C දරන ඉහළ මුත්තෙට්ටුව නමැති ඉඩමට බයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් සාදන ලද 1988 ජූනි 15 දිනැති අංක 2086A3 දරන පිඹුරෙහි ලොට් 3A ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3A, උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : p.p co 5529 හි ලොට් 11 ද දකුණට : ලොට් 3B ද, බස්නාහිරට : ලොට් 8 (අඩි 15 පාරට වෙන් කළ කොටස) ද මායිම්ව එකී අංක 2086 A3 දරන පිඹුරට අනුව පර්චස් පනහයි දශම දෙකයි පහක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති සියලු දේ සමග වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2638/135හි ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

එකී මිරිහාන එක්වත්ත පාරේ, පිහිටි ඉහළ මුත්තෙට්ටුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් සාදන ලද 1986 මාර්තු මස 20 දිනැති අංක 2086 දරන පිඹුරෙහි ලොට් 8 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 8 උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 3, 4, 5 සහ 6 ද, දකුණට : ලොට් 7 ද, බස්නාහිරට : එක්වත්ත පාරේ වරිපනම් අංක 72 දරන දේපළ ද මායිම්ව එකී අංක 2086 දරන පිඹුරට අනුව පර්චස් දහතුනයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 13.4) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි සියලු දේ ද සමග වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2595/259හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. ආර්. එම්. මාරසිංහ,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

2015 පෙබරවාරි මස 07 වැනි දින,
ලංකා බැංකුව,
ගෑස් වර්ක් ස්ට්‍රීට්,
පිටකොටුව.

03-418

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2014.12.02 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ලඩය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2013.12.20 දිනැති අංක 633 දරන උකස් බැඳුම්කරයට අනුව

2014.10.31 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් ප්‍රතිලේඛනගත ණය (ඒ) මත රුපියල් හැත්තෑ තුන්ලක්ෂ අසූඅට දහස් දෙසිය හැට හතයි ශත හැත්තෑ තුනක (රු. 73,88,267.73) මුදල සමග ප්‍රතිලේඛනගත ණය (බී) මත රුපියල් දසලක්ෂ තිස්තුන් දහස් හාරසිය විසිහතරයි ශත හැට හයක (රු. 10,33,424.66) මුදල සමග ප්‍රතිලේඛනගත ණය (ඒ) මත රුපියල් ලක්ෂ හැට හතක (රු. 67,00,000) ක මුදල මත වසරකට සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් පොළියක් ද ප්‍රතිලේඛනගත ණය (බී) මත රුපියල් දස ලක්ෂයක (රුපියල් 10,00,000) මුදල මත වසරකට සියයට හතරක් (4%) බැගින් පොළියක් ද, 2014.11.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කැලණිය, වේරගොඩ, පාසිහේන පාරේ, අංක 30 සහ 30/1හි පදිංචි පතිරණ ගමගේ ජිනදාස මහතා සහ මහලින්ගම් ක්‍රිෂ්ණමේනන් මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. අංක 633 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් අසූහතර ලක්ෂ විසිඑක් දහස් හයසිය අනූ දෙකයි ශත තිස් නවයක (රු. 84,21,692.39) මුදල සමග 2014.11.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරු (අයකර ගැනීම්) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ (කැලණිය උප කාර්යාලය) නුන්ගමුගොඩ ග්‍රාමයේ පිහිටි දියපොරගහවත්ත, ඇටඹගහවත්ත, හකුරුගමුදෙනිය හෙවත් දෙල්ගහලන්ද, මිල්ලගහවත්ත සහ මාකෙවිටන්ගේ ක්‍රිස්ටිනා පෙරේරා විදානෙලාගෙ වත්ත හෙවත් නැදුන්ගහ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1984 මාර්තු 12 දිනැති අංක 52/1984 දරන පිඹුරෙහි ලොට් B ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් B උතුරට : පාර ද, නැගෙනහිරට : තුසිත විජේසේකරගේ ඉඩම ද, දකුණට : තුසිත විජේසේකර සහ සෝමපාල සමරවීරගේ ඉඩම ද, බස්නාහිරට : සෝමපාල සමරවීරගේ ඉඩම ද, මායිම්ව එකී අංක 52/1984 දරන පිඹුරට අනුව රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C703/39හි ලියාපදිංචි කර ඇත.

ලොට් B1 ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එස්. ඒ. ඒ. විමලවීර විසින් සාදන ලද 2011 මැයි මස 26 දිනැති අංක 582/2011 දරන පිඹුරෙහි පහත ආකාරයට විස්තර කර ඇත.

එකී නුන්ගමුගොඩ පිහිටි දියපොරගහවත්ත, ඇටඹගහවත්ත, හකුරුගමුදෙනිය හෙවත් දෙල්ගහලන්ද, මිල්ලගහවත්ත සහ මාකෙවිටන්ගේ ක්‍රිස්ටිනා පෙරේරා විදානෙලාගෙ වත්ත හෙවත් නැදුන්ගහ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලවීර විසින් සාදන ලද 2011 මැයි 26 දිනැති අංක 582/2011 දරන පිඹුරෙහි ලොට් B1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් B1 උතුරට : පාර ද, නැගෙනහිරට : තුසිත විජේසේකරගේ ඉඩම ද, දකුණට : තුසිත විජේසේකර සහ සෝමපාල සමරවීර සහ වෙනත් අයගේ ඉඩම් ද මායිම්ව, එකී අංක 582/2011 දරන පිඹුරට අනුව පර්චස් තිස්නවයයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 39.75) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ සමග වේ.

### දෙවන උපලේඛනය

එකී නුන්ගමුගොඩ පිහිටි දියපොරගහවත්ත, ඇටඹගහවත්ත, හකුරුගමුදෙනිය හෙවත් දෙල්ගහලන්ද, මිල්ලගහවත්ත සහ මාකෙවිටන්ගේ ක්‍රිස්ටිනා පෙරේරා විදානෙලාගෙ වත්ත හෙවත් නැදුන්ගහ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1984 මාර්තු 12 දිනැති අංක 52/1984 දරන පිඹුරෙහි ලොට් A (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A, උතුරට : පලිහේන පාර ද, නැගෙනහිරට : එම්. බී. රූපවතී උරුමකම් කියන ඉඩම (වරිපනම් අංක 32) ද, දකුණට : පාර ද, බස්නාහිරට : එච්. දිසානායක හා වෙනත් අය උරුමකම් කියන ඉඩම ද මායිම්ව එකී අංක 52/1984 දරන පිඹුරට අනුව පර්චස් තුනයි දශම තුනයි පහක (අ. 0, රූ. 0, පර්. 3.35) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C513/28හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. ආර්. එම්. මාරසිංහ,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
ගෑස් වර්ක් ස්ට්‍රීට්,
පිටකොටුව.
2015 පෙබරවාරි මස 17 වැනි දින.

03-416

---

### මහජන බැංකුව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.12.19 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. ලෝරන්ස් විසින් සහතික කරන ලද 2013.09.11 දිනැති අංක 5144 2011.12.30 දින සහතික කරන ලද අංක 2284 සහ අංක 2286 උකස්කර ප්‍රකාර ගෙවීම්,

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව PV 61427 යටතේ ලියාපදිංචි වී ඇති මිරන්ත හෙවි ෆැබ් ට්‍රේඩින් ඇන්ඩ් ට්‍රේනින් ඉන්ස්ටිටියුට් පුද්ගලික සමාගම යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී අංක 5144 දරන උකස්කරය යටතේ දැනට රුපියල් හැත්තෑ ලක්ෂ හැට හය දහස් හයසිය හැට හයයි ශත හැට නවය (රු. 70,66,666.69) ක මුදලක්, අංක 2284 දරන උකස්කරය යටතේ දැනට රුපියල් විසිපන් ලක්ෂයයි ශත දහයක (රු. 25,00,000.10) මුදලක් සහ අංක 2286 දරන උකස්කරය යටතේ දැනට රුපියල් හතලිස් හය ලක්ෂයක (රු. 46,00,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2014.07.01 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් හැත්තෑ ලක්ෂ හැටහය දහස් හයසිය හැට හයයි ශත හැට නවයක (රු. 70,66,666.69) මුදලක් ද, 2014.07.01 දින සිට වර්ෂයකට 15% බැගින් රුපියල් විසිපන් ලක්ෂයයි ශත දහයක (රු. 25,00,000.10) මුදලක් සහ 2014.07.01 දින සිට වර්ෂයකට 16% බැගින් රුපියල් හතලිස් හයලක්ෂයක

(රු. 46,00,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හැත්තෑ ලක්ෂ හැට හය දහස් හයසිය හැට හයයි ශත හැට නවය (රු. 70,66,666.69) ක මුදල රුපියල් විසිපන් ලක්ෂයයි ශත දහය (රු. 25,00,000.10) ක මුදල සහ රුපියල් හතලිස් හයලක්ෂයක (රු. 46,00,000) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 5144, 2284 සහ 2286 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරී පත්තුවේ, සියනෑ කෝරළේ, මහර ප්‍රාදේශීය සභා සීමාවට අයත් දළුපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දළුපිටිය ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න මහතා විසින් 2003.10.10 වැනි දින මැන සකස් කරන ලද අංක 311A/2003 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක ඒ දරන කොටසට මායිම්, උතුරට : වෙල ද, නැගෙනහිරට : ආර්. ශ්‍රියානිගේ ඉඩම සහ අංක 310/1993 පිඹුරෙහි ලොට් අංක 3B, දකුණට : අංක 310/1993 පිඹුරෙහි ලොට් අංක 3B සහ දළුපිටිය පාර ද, බස්නාහිරට : ඒ. ඒ. සුමිත්‍රාගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොලහයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 11.20) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොල, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක C1019/33 යටතේ ලියාපදිංචිකර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කල කොටස්වල මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

03-346

---

### මහජන බැංකුව - පානදුර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී(29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.10.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කලුතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ආර්. රොද්‍රිගෝ විසින් සහතික කරන ලද 2013.11.12 දිනැති අංක 11403 දරන උකස්කරය ගනේ ආරච්චිගේ සයුරි කෝකිලා පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද එකී අංක 11403 දරන උකස්කරය යටතේ දැනට රුපියල් මිලියන අටයි අටසිය පනස් දහසක් (රු. 88,50,000) මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද ඉහත කී රුපියල් මිලියන අටයි අටසිය පනස් දහසක (රු. 88,50,000) මුදල මත වර්ෂයකට 19% බැගින් 2014.04.12 දින සිට විකිණීමේ දිනය දක්වා පොළිය ද සහ අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී මුදල් අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 11403 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

#### *උපලේඛනය*

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබද්දේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 671/A ගොරකාන දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කෙසෙල්වත්ත කඳුරුදූවේ පිහිටි මාදන්ගහඕවිට අටුන්නගහදෙනියේ කැබැල්ල නමැති ඉඩමේ මේ කැබලි ඇති 4ට අවසරලත් මානක ජී. ඕ. ආර්. සිල්වා විසින් 2000.08.27 වැනි දින මැන සාදන ලද අංක 3295 දරන පිඹුරේ දැක්වෙන අංක 4 කැබැල්ල නමැති ඉඩමට එකී අංක 3295 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක 2427 දරන පිඹුරේ අංක 10 දරන කැබැල්ල ද, නැගෙනහිරට : අංක 11 දරන කැබැල්ල ද (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කල කැබැල්ල) දකුණට : අංක 11 දරන කැබැල්ල ද, (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කල කැබැල්ල) බස්නාහිරට : කැබලි අංක 10 දරන කැබැල්ල ද (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කල කැබැල්ල) යන මායිම් තුළ පිහිටි පර්චස් අටයි දශම හතයි තුනයි (අ. 0, රූ. 0, පර්. 8.73)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදිය වේ.

ඉහත ඉඩම පහත සඳහන් ඉඩම නැවත මැනුමකි.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 89/42 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබද්දේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 671/A ගොරකාන දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කෙසෙල්වත්ත කඳුරුදූවේ පිහිටි මාදන්ගහඕවිට අටුන්නගහදෙනියේ කැබැල්ල නමැති ඉඩමේ කැබලි අංක 4ට අවසරලත් මානක එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් 1990.01.22 දින මැන සාදන ලද අංක 7764 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 4ට එකී අංක 7764 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : අංක 2427 දරන පිඹුරේ අංක 10 දරන කැබැල්ල ද, නැගෙනහිරට : අංක 11 දරන කැබැල්ල ද (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන්කල කැබැල්ල) දකුණට : අංක 11 දරන කැබැල්ල ද (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන්කල කැබැල්ල) බස්නාහිරට : කැබලි අංක 10 දරන කැබැල්ල ද, (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන්කල කැබැල්ල) යන මායිම් තුළ පිහිටි පර්චස් නවයක (අ. 0, රූ. 0, පර්. 9)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදිය වේ.

මාර්ගය දිගේ සහ මතින් හා ගමන් කිරීමේ අයිතිය ද සමග :

1. පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 62/06 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර

තොටමුණ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 671/A ගොරකාන දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කෙසෙල්වත්ත කඳුරුදූවේ පිහිටි මාදන්ගහඹිවිට අටුන්නගහදෙනියේ කැබැල්ල නමැති ඉඩමේ කැබලි අංක 10ට අවසරලත් මානක එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් 1990.01.22 දින මැන සාදන ලද අංක 7764 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 10ට එකී අංක 7764 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : පාර ද (අඩි 20ක් පළල පාර), නැගෙනහිරට : අංක 7764 දරන පිඹුරේ සඳහන් අංක 11, 4, 5, 7, 8, 9 දරන කැබලි ද, දකුණට : කඳුරුදූව පාර ද, බස්නාහිරට : අංක 871 දරන පිඹුරේ සඳහන් ඒ හා බී කැබලි ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරක් (අ. 0, රූ. 0, පර්. 14) විශාල ඉඩම වේ.

2. පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යලයේ දී ඩී 89/43 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබද්දේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 671/A ගොරකාන දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කෙසෙල්වත්ත කඳුරුදූවේ පිහිටි මාදන්ගහඹිවිට අටුන්නගහදෙනියේ කැබැල්ල නමැති ඉඩමේ කැබලි අංක 11ට අවසරලත් මානක එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් 1990.01.22 දින මැන සාදන ලද අංක 7764 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 11ට එකී අංක 7764 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක 2427 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 54 සහ 10 දරන කැබලි ද, නැගෙනහිරට : අංක 1, 2, 3 දරන කැබලි ද, දකුණට : අංක 5 හා 6 දරන කැබලි ද, බස්නාහිරට : අංක 10 දරන කැබැල්ල ද (පාරකට වෙන්කළ) යන මායිම් තුළ පිහිටි පර්චස් පහක් (අ. 0, රූ. 0, පර්. 5) විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
අංක 341, ගාලු පාර,
පානදුර.

03-347

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පීකිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 662299.
පල්ලියවත්තගේ රංජිත් පෙරේරා.

2014 දෙසැම්බර් මස 19 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. පී. පෙරේරා විසින් 2010 සැප්තැම්බර් මස 17 වැනි දින සහතික කරන ලද අංක 1381 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පල්ලියවත්තගේ රංජිත් පෙරේරා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් අසූඅටලක්ෂ විසිඑක්දහස් නමසිය දහතුනයි ශත දාහතර (රු. 88,21,913.14)ක මුදලක් 2014 ඔක්තෝබර් 28 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අසූඅටලක්ෂ විසිඑක්දහස් නමසිය දහතුනයි ශත දාහතර (රු. 88,21,913.14) මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ඔක්තෝබර් 29 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 81,68,292.80ක මුදල මත 15.50%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 1381 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ස්ඩ්‍රෝෆ් වීදියේ අංක 182 දරන ස්ථානයේ 3 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටුනායක-සීදූව නගර සභා සීමාවේ බණ්ඩාරවත්ත ගමේ පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් 2007 ජූනි 2 වන දින සාදන ලද අංක 3182A දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අඩි 12ක් පළල පාර ද, නැගෙනහිරට : බී. චමින්ද උපුල් ප්‍රනාන්දුට අයිති ඉඩමෙන් ද, දකුණට : ජී. රෝගුස් සිල්වාට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ එකී අංක 3182A දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිපහයි දශම හත (අ. 0, රූ. 0, පර්. 25.7) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටුනායක-සීදූව නගර සභා සීමාවේ බණ්ඩාරවත්ත ගමේ පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. කේ. එස්. බමුණුසිංහ විසින් 2006 ජූනි 8 සහ 15 දින සාදන ලද අංක 2006/96 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අඩි 12ක් පළල පාර ද, නැගෙනහිරට : අංක 4176 දරන පිඹුරේ ලොට් 7ත් ද, දකුණට : ජී. රෝගුස් සිල්වාට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ එකී අංක 2006/96 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිපහයි දශම හත (අ. 0, රූ. 0, පර්. 25.7) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව C957/195 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්,

03-392

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 1068274, 1639019 සහ 1639035
රොටුක් ඉන්ටනැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

2014 ඔක්තෝබර් මස 31 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිව සම්මත කරන ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ජී. සී. නන්දිසේන විසින් සහතික කරන ලද 2011 දෙසැම්බර් මස 20 වැනි දින අංක 1991 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරය යටතේ (1 වන උපලේඛනයේ වැඩිමනත්ව විස්තර වන දේපළ) කුරුණෑගල කොළඹ පාරේ අංක 259 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන රොටුක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා සිංගප්පුලි ආරච්චිගේ කාංචන විකසිත අබේවීර උකස්කරු වශයෙන්

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ජී. සී. නන්දිසේන විසින් සහතික කරන ලද 2011 දෙසැම්බර් මස 20 වැනි දින අංක 1992 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී දැන් කෙමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරය යටතේ (2 වන උපලේඛනයේ වැඩිමනත්ව විස්තර වන දේපළ) රොටුක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා සිංගප්පුලි ආරච්චිගේ කාංචන විකසිත අබේවීර සහ සංගිප්පුලි ආරච්චිගේ ස්ටීවන් අබේවීර උකස්කරුවන් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්කෝටි අනූඑක් ලක්ෂ විසිහත්දහස් නවසිය හැත්තෑ දෙකයි ශත දහනවයක (රු. 3,91,27,972.19) ක මුදලක් 2014 සැප්තැම්බර් මස 15 වැනි දින විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තුන්කෝටි අනූ එක්ලක්ෂ විසිහත්දහස් නවසිය හැත්තෑ දෙකයි ශත දහනවයක (රු. 3,91,27,972.19) ක මුදල හා 2014 සැප්තැම්බර් මස 16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට (රු. 1,96,40,000) ක මුදලක් සඳහා වාර්ෂිකව 9.17% (PLR+2.5%) බැගින් වූ පොළිය ද හා රුපියල් 1,68,56,629 සඳහා වාර්ෂිකව 10.91% (PLR+3%) බැගින් වූ පොළියක් ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද, මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අය කර ගැනීම සඳහා එකී අංක 1991 හා 1992 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ ( විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ කෝරළේ, කෙන්ගල්ල ගමේ පිහිටි අන්ගන්තැන්න එස්ටේට් සහ අන්ගේතැන්න නොහොත් අන්කඳුරේ වත්ත එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ආර්. ආර්. ජේ. ආර්. ජයකොඩි විසින් 2007.06.30 වැනි දින සාදන ලද අංක 100B පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 2/241 දරන ඉඩම (මෙම ඉඩම බලයලත් මානක අයි. විජේකෝන් විසින් 2006.05.01 වැනි දින නැවත මැන සාදන ලද අංක 531A දරන පිඹුරේ අතුරු බෙදීමක් ලෙස නිරූපිත ලොට් 2/183, 2/185, 2/200 සිට 2/215 දක්වා, 2/229 සිට 2/297 දක්වා සහ ලොට් 3/298 සිට 3/311 දරන ඉඩම් කොටස්) මෙම ඉඩම් කොටස් බලයලත් මානක ජී. බී. දොඩන්වල විසින් 1999.09.12 වැනි දින නැවත මැන සාදන ලද අංක 3234 පිඹුරේ අතුරු බෙදීමක් ලෙස නිරූපිත ලොට් 1, 2 සහ 3 වේ. ඉහත කී ලොට් 2/241 දරන ඉඩමට මායිම් එනම්, උතුරට : ලොට් අංක 2/240න් ද, නැගෙනහිරට : පාර (R25), දකුණට : ලොට් 2/242න් ද හා බස්නාහිරට : පාර (R26) යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් පහළොවයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 15.78) මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිුරුව E855/277හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමට ඉහත කී පිඹුරු අංක 100B නිරූපිත (R26) R(25) පාර සහ පිඹුරු අංක 531B පිඹුරේ නිරූපිත පාර (R1) ප්‍රාදේශීය සභා/ප්‍රධාන මාර්ග ඔස්සේ උඩින්, යටින් යෑමට - ඒමට ද පාගමනින්, වාහන ගමනා ගමනය සහ විදුලි සහ විදුලි සංදේශ රැහැන් එලීම, ජලා පවහන පද්ධතිය, ජලනල එලීම, උඩින් වයර් ඇදීම සහ අනිකුත් පහසුකම් ඇතුළු සියලු අයිතිවාසිකම් සමග වේ.

### 2 වැනි උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල නගර සභා සීමාවන් තුළ වැහැර සහ මැදමීගම ගම්වල පිහිටි බෝක්කුවලාගේ ඉඩම, විදානෙමුත්තෙට්ටුවේ පංගුව කොටස සහ උලියන්පංගුවේ කුඹුර නමැති ඉඩමට බලයලත් මානක කේ. එස්. දසනායක විසින් 2011 ජුනි මස 03 වැනි දින පිඹුරු අංක 1451හි නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1A නමැති ඉඩම් කොටසට මායිම් එනම්, ඊසානට : පිඹුරු අංක 4730හි ලොට් 2න් ද, ගිණිකොණට : පිඹුරු අංක 4730හි ලොට් 21 ද, ඇල සහ පිඹුරු අංක 4730හි නිරූපිත ලොට් 6න් ද, නිරිතට : පිඹුරු අංක 4730 හි නිරූපිත ලොට් 4න් ද සහ වයඹට : කොළඹ කුරුණෑගල පාරෙන් ද (ආර්. ඩී. ඒ) යන මෙකී මායිම් තුළ පර්චස් දහයයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.40) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු සියලු දේ.

ඉහත කී ඉඩම මෑතක දී කරන ලද මැනුමක් අනුව පහත පරිදි විස්තර වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල නගර සභා සීමාවන් තුළ වැහැර සහ මැදමීගම ගම්වල පිහිටි බෝක්කුවලාගේ ඉඩම, විදානෙමුත්තෙට්ටුවේ පංගුව කොටස සහ උලියන්පංගුවේ කුඹුර නමැති ඉඩමට බලයලත් මානක ජී. එස්. ගලගෙදර විසින් 1994 ජුනි මස 30 වැනි දින සාදන ලද අංක 4730 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 3 නමැති ඉඩම් කොටසට මායිම්, එනම් ඊසානට : පිඹුරු අංක 4730හි ලොට් 2 සහ ප්‍රධාන පාරෙන් ද, නැගෙනහිරට : අඩි 5 පළල මාර්ග ප්‍රවේශයෙන් ද, දකුණට : ලොට් 6 සහ ලොට් 4න් ද සහ බස්නාහිරට : ප්‍රධාන මාර්ගයෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.40) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ වගාව ඇතුළු සියලු දේ.

මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ A/1598/288හි ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්,

03-400

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.